රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:- 266

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07,
1984 සැප්තැම්බර් මස 12 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා සභාපතිවරුන් වෙත.

## ආයතන සංග්‍රහයේ xiv පරිච්ඡේදය යටතේ සංයුක්ත දීමනා සංශෝධනය කිරීම.

1981.05.29 දින සහ අංක 366 දරණ ආයතන චක්‍රලේඛ ලිපියෙහි 2(1) ඡේදය සම්බන්ධවය. 1984.10.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රජයේ නිලධරයින්ට හා සංස්ථා සේවකයින්ට ගෙවිය යුතු සංයුක්ත දීමනා පහත දැක්වෙන පරිදි වේ.

| වැටුප (නව ඒකාබද්ධ) | එක් එක් පූර්ණ 24 පැයක කාලයක් සඳහා සංයුක්ත දීමනාව. |
|---|---|
| වාර්ෂික වැටුප රු.6900/- සහ ඊට අඩුව ලබන නිලධරයෙකුට/සේවකයෙකුට | රු.50.00 |
| වාර්ෂික වැටුප රු.6901/- සිට රු.13,500/- දක්වා ලබන නිලධරයෙකුට/සේවකයෙකුට | රු.60.00 |
| වාර්ෂික වැටුප රු.13,501/- සිට රු.30,400/- දක්වා ලබන නිලධරයෙකුට/සේවකයෙකුට | රු.70.00 |
| වාර්ෂික වැටුප රු.30,401/- සහ ඊට වැඩිය ලබන නිලධරයෙකුට/සේවකයෙකුට | රු.90.00 |

02. මෙම සංශෝධිත සංයුක්ත දීමනා ගෙවීමට 1984 වර්ෂයේ ගමන් වියදම් සඳහා අතිරේක මුදල් කිසිවක් සැලසිය යුතු නොවේ.

ආයතන අධ්‍යක්ෂ.